
# රණවිරැණ

සංවත්සර විශේෂ කලාපය

37 වන කලාපය
2021 ජනවාරි - මාර්තු

## 140 වසක අභිමානය





1881 - 2021



# පරිණත නායකත්වයක් තුළින් 45 වන සේනාවිධායක ලෙස ...



වසර 140 ක් තරම් වන අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 45 වන සේනාවිධායක ලෙස යුද්ධ හමුදාව තුළ අත්දැකීම් බහුල, දක්ෂ නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් යුද්ධ හමුදා චාරිත්‍රානුකූලව ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් 2021 පෙබරවාරි මස 28 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිය රාජකාරී අරඹන ලදී.

යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල මුර පිරික්සුමකින් හා සම්මාන මුරයකින් නව සේනාවිධායකතුමන් වෙත ගෞරව පුදකරමින්, ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී විසින් පිළිගන්නා ලද අතර, එළැඹි සුබ මොහොතින් සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ නව සේනාවිධායකතුමන් රාජකාරී භාරගන්නා ලදී.

අනතුරුව හටපිරිස් ආමන්ත්‍රණය කිරීම සිදුකළ අතර, නව කඳවුරු පරිශ්‍රය තුළ සිහිවටනයක් ලෙස පැළයක් රෝපණය කරමින් එතුමන් සිය රාජකාරී භාරගැනීම සංකේතාත්මකව සනිටුහන් කරන ලදි.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් යුද්ධ හමුදාවේ පැරණිතම හා වර්ණලාභි රෙජිමේන්තුවක් වන කාලතුවක්කු හමුදාව වෙතින් බිහිවූ දැණුමෙන් හා අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස හඳුන්වාදිය හැකි අතර, එතුමන් මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාලතුවක්කු රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක තනතුරද හොබවනු ලබයි. 45 වන සේනාවිධායක ලෙස ස්වේච්ඡා බළසේනාව වෘත්තීමය හමුදාවක් ලෙස ඉහළ තලයකට ඔසවා තැබීමට වත්මන් සේනාවිධායකතුමන්ට හැකි වේවායි ස්වේච්ඡා බළසේනාවේ සුභාශිංසන, රණවරුණ ඔස්සේ මෙසේ එක් කරන්නෙමු.












# 140 වසක් පසුකළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව.

## අභිමන් මඟක පියසටහන්...

ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡා බලසේනා ඉතිහාසය පිළිබඳව තතු විමසීමේදී එය 1860 දශකය දක්වා දිව යන්නකි. කන්ද උඩරට ගිවිසුම මගින් ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතු වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ විවිධ බළඇණි වරින් වර ලංකාවේ ආරක්ෂක කටයුතුවල නිරත වී ඇත. මෙම කාලසීමාවේදී එනම් 1861 අප්‍රේල් 11 වන දින මාතලේ සහකාර ඒජන්ත කාර්යාලයේදී එවකට සහකාර ඒජන්ත බ්‍රෝඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් ස්වේච්ඡා රයිෆල් රෙජිමේන්තුවක් පිහිටුවා ගැනීම සඳහා සාකච්ඡා කර අවශ්‍ය අණපනත් කෙටුම්පත් සකසා එය බ්‍රිතාන්‍ය මහරැජින වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ස්වේච්ඡා හමුදාවක් නඟා සිටුවීම සඳහා වූ නියෝගය 1862 ජූලි මස 5 වන දින අංක 3326 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. කෙසේ නමුත් එම ගැසට් පත්‍රයේ සඳහන් විවිධ කොන්දේසි හේතුවෙන් සහ වෙනත් හේතූන් මත 1862 වසරේදී රයිෆල් බළකාය නමින් ස්වේච්ඡා ඒකකයක් ස්ථාපනය කිරීමට නොහැකි විය.

කෙසේ නමුදු ඊට වසර 19 කට පසු, එනම් 1881 අප්‍රේල් 01 දින ලාංකිකයින් හා සුදු ජාතිකයින්ගේ එකතුවෙන් ස්වේච්ඡා හමුදාවක් "Ceylon Volunteers" නමින් ස්ථාපනය කරන ලද අතර එය ලංකාව තුළ ස්ථාපිත වූ ප්‍රථම පාබල බළඇණිය විය. "ලුතිනන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ්" එහි අණදෙන නිලධාරී වශයෙන් පත් කරන ලද අතර, එම බළඇණිය පාලනය වූයේ ලංකා ආණ්ඩුකාරවරයා යටතේය. ආරම්භයේදී පාබල බළඇණියක් වූ මෙය පසුව අශ්වාරෝහක කණ්ඩායමක්, කාලතුවක්කු කණ්ඩායමක්, ගිලන් මැසි කණ්ඩායමක්, ඉංජිනේරු කණ්ඩායමක් හා තූර්ය වාදක කණ්ඩායමකින් සමන්විත විය. 1881 ආරම්භ වූ ස්වේච්ඡා බළකාය ක්‍රමයෙන් වර්ධනය වී 1910 වර්ෂය වන විට බළඇණි කිහිපයක් දක්වා වර්ධනය විය. 1888 අප්‍රේල් 20 වන දින බඳවා ගන්නා ලද ස්වේච්ඡා සාමාජිකයින් 27 දෙනෙකුගෙන් යුත් බණ්ඩය ලංකා ස්වේච්ඡා කාලතුවක්කු හමුදාව නගාසිටුවීමට බඳවාගෙන ඇත. පසුව එම ඒකකය ලංකා ආරක්ෂක සේනා කාලතුවක්කු හමුදාව විය. 1881 ජූලි මස 29 වන දින ගිලන්මැසි කණ්ඩායමක් වශයෙන් ආරම්භ කරන ලද කණ්ඩායම පසුකාලීනව එනම් 1911 ජූනි මස 13 දින ලංකා වෛද්‍ය බළකාය ලෙස නම් විය. ශ්‍රී ලංකා ස්වේච්ඡා වෛද්‍ය බළකායේ ආරම්භය එය විය. 1892 ජූලි මස 12 වන දින ලංකා පාබල හමුදා අශ්වාරෝහක කණ්ඩායම නගාසිටුවන ලදී. මවුන්ටඩ් ඉන්ෆැන්ට්‍රි නමින් හැඳින්වූ මෙම පාබල අශ්වාරෝහක කණ්ඩායම 1906 දී සිලෝන් මවුන්ටඩ් රයිෆල් නමින් වෙනම බළඇණියක් වශයෙන් ක්‍රියා කළ අතර මෙය 1937 දී විසුරුවා හරින ලදී. පාබල හමුදා ඉංජිනේරු කණ්ඩායම වශයෙන් ක්‍රියාකළ එෆ් කණ්ඩායම 1911 ක්ෂේත්‍ර ඉංජිනේරු කණ්ඩායමක් වශයෙන් ප්‍රතිසංවිධානය කරන ලද අතර පසුව එය සිලෝන් ඉංජිනියර්ස් නම් විය. 1910 දී ස්වේච්ඡා බළකාය ලංකා ආරක්ෂක බළසේනාව **(CEYLON DEFENCE FORCE)** වශයෙන් ප්‍රතිසංවිධානය විය.

1922 ලංකා ආරක්ෂක බළසේනාව බ්‍රිතාන්‍ය රජයේ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය මගින් ගෞරවයට පාත්‍ර කරන ලදී. මෙම වකවානුවේදී ඇතිවූ විශේෂිතම සිදුවීම වන්නේ 1922 මාර්තු මාසයේදී අති උත්තම එඩ්වඩ් වේල්ස් කුමාරයා (පසුව අටවන එඩ්වඩ් රජතුමා) ලංකාවට පැමිණීමයි. මෙම අවස්ථාවේදී ලුතිනන් කර්නල් ටී ජී ජයවර්ධන වීඩී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී වූ අතර ලංකා පාබල හමුදා ඒකකයට 1922 මාර්තු මස 22 වන දින රාජකීය වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය සිදු කරන ලදී.

ස්වේච්ඡා හමුදා සාමාජිකයින් ප්‍රථම වතාවට විදේශීය හමුදාමය කටයුතු සඳහා සිය දායකත්වය දක්වන ලද්දේ 1899 පාබල හමුදා අශ්වාරෝහක කණ්ඩායම දකුණු අප්‍රිකාවේ බෝයර් යුද්ධයට සහභාගීවීමෙනි. 1914 සිට 1918 දක්වා පළමු වන ලෝක සංග්‍රාමය යටතේ විදෙස් යුද සේවා කටයුතු සඳහා ස්වේච්ඡා සෙබළුන් 100 ක සංඛ්‍යාවක් වෙනත් යුද පෙරමුණුවල සේවය කිරීමට තෝරාගෙන තිබුණත්

එය අවලංගු විය. ඊට හේතුව වූයේ රටේ අභ්‍යන්තර ආරක්‍ෂාව සඳහා සෙබළුන් රඳවා ගැනීම අවශ්‍ය වූ බැවිනි. එයින් සෑහීමකට පත් නොවූ ස්වේච්ඡා හමුදා සාමාජිකයින් ඔවුන්ගේ දැඩි කැමැත්ත මත නිලධාරීන් 11 දෙනෙකු සහ සෙසු නිලයින් 73 දෙනෙකු බ්‍රිතාන්‍ය ඒකකවලට බැඳී යුරෝපයේ සටන් පෙරමුණුවල විශිෂ්ඨ සේවාවල නිරතවී ඇත. දෙවන ලෝක යුද සමයේ නව බළඇණි කිහිපයක් නැවත ආරම්භ කරන ලද අතර ඒවා නම් කොළඹ නගර ආරක්‍ෂක බළකාය, තැපැල් හා විදුලි සංඥා බළකාය, රේල්වේ ඉංජිනියරිං කෝප්, සිලෝන් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් මිකැනිකල් කෝප් යන බළඇණි වේ. එසේම ටෙරිටෝරියල් සර්විස්ද 1943 වර්ෂයේදී ආරම්භ කර 1946 දී විසුරුවා හරින ලද අතර එය ලංකා ආරක්‍ෂක බළසේනාවේ ප්‍රථම කාන්තා බළකාය විය. ද සිලෝන් කෝ මිලිටරි පොලිස් 1944 දී ආරම්භ කර 1946 දී විසුරුවා හැර ඇති අතර ද සිලෝන් සිග්නල් 1943 දී ආරම්භ කර ඇත.

1948 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග 1949 වර්ෂයේදී නිත්‍ය හමුදාව ආරම්භ වන තෙක් මූලාරම්භයේ සිට එවකට පැවති බොහෝ බළඇණි වරින් වර විවිධ හේතූන් මත විසිරුවා හැර ඇති අතර ස්වේච්ඡා බළසේනාවේ සංවිධානය හා සංයුතිය ද වරින් වර වෙනස්වීම් වලට භාජනය වී ඇත. ලංකාව නිදහස ලැබූ මුල් කාලයේ ස්වේච්ජා බළකායේ කැපී පෙනෙන අවස්ථා දෙස බැලීමේදී 1953 හර්තාලය පාලනය කිරීම සඳහා සක්‍රීය සේවා රාජකාරී ඉටුකිරීම හැඳින්විය හැක. එසේම 1954 බ්‍රිතාන්‍ය මහ රැජිනගේ පැමිණීම හා එම අවස්ථාවේ ගාලු මුවදොර පිටියේදී 2 වන ලංකා පාබල හමුදාව වෙත රැජිනගේ හා බළකා වර්ණ ප්‍රදානය ඉතා උත්කර්ෂවත් උත්සවයකදී සිදු කෙරුණු අතර, 1980 අගෝස්තු මස 15 වන දින 2, 3 (සෙවි) ගැමුණු හේවා බළකාය වෙත ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ පිරිනැමිණි.

1972 මැයි මස 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශ කිරීමත් සමග එතෙක් “ලංකා ස්වේච්ජා බළකාය” නමින් හැඳින්වූ නාමය වෙනස් වී එය “ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව” ලෙස නාමකරණය විය. මේ හේතුවෙන් ඒකකයන්ගේ නාමයන්ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ පිළිවෙල අනුව සැකසිණ. වර්තමානය වන විට එය ඒකක 84 කින් සැදි 55000 කට ආසන්න භට පිරිසකගෙන් පරිපූර්ණ වී ඇත. ආරම්භක අවධියේ සිට රටේ අභ්‍යන්තරික වශයෙන් ආරක්‍ෂක කටයුතුවල නියැලුණු අතර යුධමය අවස්ථාවල දී රට අභ්‍යන්තරයේ මෙන්ම විදේශීය යුධමය තත්වයන්හිදී ද ස්වේච්ඡා බළසේනාවට අයත් භට පිරිස් සක්‍රීය යුධ සේවය සඳහා කැඳවා ඇත.

නැවත 1983 වර්ෂයේ සිට මේ දක්වා ස්වේච්ඡා බළසේනාව අඛණ්ඩව සක්‍රීය සේවයේ යෙදී සිටිමින් නන්දිකඩාල් කලපුවෙන් අවසන් ත්‍රස්තවාදියා විනාශයට පත්කරන තෙක් තම මව්බිම වෙනුවෙන් ස්වේච්ඡා බළසේනා සාමාජිකයන් සිය සක්‍රීය දායකත්වය ලබාදෙන ලදි. ගෙවී ගිය තිස් වසක යුද ඉතිහාසය තුළ ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් රණබිමේ දී කළ කැපකිරීම් අපමණය. එහිදී ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ ප්‍රථම වරට පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ නිලධාරීයා ලෙසින් කපිතාන් සාලිය අලදෙනිය ඉතිහාසයට එක්විය. එකී යුග මෙහෙවරේදී සිය රණකාමීබව පෙන්වූ ස්වේච්ඡා බළසේනාවට අයත් නිලධාරී 140 දෙනෙකු හා සෙසුනිළයින් 3790 ක් රට වෙනුවෙන් තම ජීවිත පූජාකර ඇති අතර, නිලධාරී 168 දෙනෙකු හා සෙසුනිළයින් 3642 ක් රණක්ෂිත තත්වයට පත්ව ඇත.

යම්කිසි සංවිධානයක සාර්ථකත්වය මැනිය හැකිවනුයේ එම සංවිධානය තුළින් ඉටු කෙරෙන සේවාව මත නම් යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව උච්ජස්ථානයක පවතිනුයේ එවකට එහි සිටි බොහොමයක් සාමාජිකයින් විසින් ලබාදුන් උදාර දායකත්වය නිසාවෙන් බව පැහැදිළි වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ආග්‍රාමාත්‍ය ධූරය දැරූ මහාමාන්‍ය ඩී. එස් සේනානායක, ජෙනරාල් සර් ජෝන් කොතලාවල මැතිතුමන් වැනි ශ්‍රී ලංකාව තුළ බිහිවූ අග්‍රගන්‍ය නායකයන් රැසක් ස්වේච්ඡා බළසේනාවෙන් බිහිව තිබීම ස්වේච්ඡා සාමාජිකයන් වූ අපට ආඩම්බර විය හැකි කරුණකි. තවද ශ්‍රී ලංකාවේ එදා මෙදා තුර ඔලිම්පික් පදක්කම් දිනූ ඩන්කන් වයිට්, සුසන්තිකා ජයසිංහ වැනි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ද ස්වේච්ඡා බළසේනාවෙන් කෙළිබිමට පිවිසි අයවළුන් වීමද ශ්‍රී ලංකාවේ විශාලතම කළමනාකරණ ව්‍යුහය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ස්වේච්ඡා සාමාජිකයන් වශයෙන් ගණකාධිකාරින්, නිතීවේදීන්, වෛද්‍යවරුන් ඇතුළු විවිධ වෘත්තීයවේදින් රාජකාරීන්වල නියුක්ත කරවීමට හැකි වීමද මෙම බළසේනාවේ අභිමානය ඉහළට ඔසවා තැබීමට හේතු වී ඇත.

මීට වසර කිහිපයකට ඉහතදී සාලාව යුද්ධ හමුදා කඳවුරු පරිශ්‍රයේ සිදුවූ ව්‍යසනයේදී ස්වේච්ඡා බළසේනා මූලස්ථානයද බරපතල ලෙස හානියට ලක් වුවද, එම භෞතික විනාශය හමුවේ ස්වේච්ඡා බළසේනාවේ අභිමානය කිසිසේත් බිඳහෙළිය නොහැකි විය. එය පෙරට වඩා ශක්තිමත්ව ගොඩනැගෙමින් අද වන විට වත්මන් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ ගොඩනැගෙනුයේ සියලු පහසුකම්වලින් අනූන පරිසර හිතකාමී ඉදිකිරීම් රැසක්ද සමගිනි. එහිදී ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී ගේ අධීක්ෂණයද, සියලු ස්වේච්ඡා සාමාජික සාමාජිකාවන්ගේ සාමූහික කැපවීමද එකී සාර්ථකත්වය පිටුපස යෝධ ශක්තියක් බවට පත්ව ඇත. එසේම වසර 140 ක ප්‍රෞඪ ඉතිහාසය තුළ ස්වේච්ඡා බළසේනාවේ සාර්ථකත්වය උදෙසා සේනාවිධායකවරුන් 44 දෙනෙකු හා නියෝජ්‍ය සේනාවිධායකවරුන් 28 දෙනෙකු විසින් ඔවුන්ගේ කාලය ශ්‍රමය කැපකොට ලබාදුන් නායකත්ව මඟපෙන්වීමද සුවිශේෂී වේ.

එවන් වූ අනගිභවනීය දායකත්වයක් තුළින් සියවසකුත් අඩසියවසකට ආසන්න කාලයක් මුළුල්ලේ අභිමානවත්ව ගොඩනැඟුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව රණබිමෙහි, කෙළිබිමෙහි මෙන්ම වෘත්තීමය හමුදාවක් ලෙසින් මතෘභූමියේ සංවර්ධනාත්මක ඉලක්ක සාක්ෂාත්කරණය උදෙසා වර්තමානයේදීද සිය දායකත්වය සපයමින් අප්‍රේල් මස 01 වන දින 140 වසක ගමන් මගෙහි අභිමානය මෙසේ ආවර්ජනය කර සිටිමු.



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී විසින් 140 වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කරනු ලබන පණිවුඩය

යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වෙනි සංවත්සරය යෙදෙන අද දින එහි සේනාවිධායක ලෙස ඔබ සැම වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකන අතර, සංවත්සර දිනය වෙනුවෙන් ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජිකයන් හට මාගේ සුභාශිංසන මේ මොහොතේ පිරිනමමි.

දේශය සුරැකීම උදෙසා වූ දීර්ඝ මෙහෙවරක නියැළී නිලධාරීන් හා සෙසුනිලයින් පනස් පන්දහසකට අධික සාමාජික පිරිසකගෙන් සමන්විත ස්වේච්ඡා බළසේනාව අද වන විට යුද්ධ හමුදාව තුළ අතු පතර විහිදී ගිය දැවැන්ත වෘක්ෂයක් ලෙසින් සමස්ත රටටම සෙවණ සලසමින් සිටි. අනේකවිධ දුෂ්කරතා, අභියෝග ජයගනිමින් නොසැලුණු ගමනක නියැළි ස්වේච්ඡා බළසේනාව කාලීන අවශ්‍යතා මැනවින් හඳුනා ගනිමින් දේශය වෙනුවෙන් වූ අඛණ්ඩ මෙහෙවරක යෙදීසිටී. 1881 වර්ෂයේදී Ceylon Volunteers නම් වූ එක් බළඇණියකින් ආරම්භ වී වර්තමානයේ බළඇණි 84 ක් දක්වා වර්ධනය වී ඇති ස්වේච්ඡා බළසේනාව ආරම්භක අවදියේ රටේ අභ්‍යන්තරික වශයෙන් ආරක්ෂක කටයුතුවල නිරතව සිට පසුකාලීනව විදේශීය යුධ කටයුතු සඳහාද මැදිහත් වී ඇත. විශේෂයෙන්ම බෝයර් (Boer) යුද්ධය, පළමුවන හා දෙවන ලෝක සංග්‍රාම අවධිවලදී ස්වේච්ඡා බළසේනාවට අයත් භටපිරිස් ලෝක සාමය වෙනුවෙන් විදේශීය රටවල යුධ සේවාවන් සඳහා සහභාගි වී සිය වගකීම්ද ඉටුකර ඇත.

සියවසක් ඉක්ම වූ එම ඉතිහාස කතාව තුළදී විවිධ ගැටුම්කාරී තත්වයන් සමතයකට පත්කිරීමට ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් සෘජුව හා වක්‍රව දායක වී ඇති අතර, විවිධ ස්වාභාවික ව්‍යසනයන්වලදී මහජන සුබසෙත උදෙසා කළාවූ කැපකිරීම් ස්වේච්ඡා බළසේනා ඉතිහාසය පුරා දක්නට ඇත. ගෙවී ගිය තිස් වසරක යුධ ඉතිහාසය තුළ ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් රණබිමේ දී කළ කැපකිරීම් සුවිශේෂී වේ. එහිදී ශ්‍රී ලාංකේය වංශකතාව තුළ පළමු වරට පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ නිලධාරියා ලෙසින් කපිතාන් සාලිය අලදෙනිය විරු නාමාවලියේ පළමු තැන හිමිකර ගන්නා ලදී. එසේම එකී යුග මෙහෙවරේදී විශාල පිරිසක් දේශය වෙනුවෙන් තම ජීවිතය පූජාකර ඇති අතර, රණක්ෂිතයට පත්වූ ගණන ද අති විශාලය.

වරෙක රණ බිමේද, තවත් වරෙක කෙළිබිමේ ද එකසේ දිග්විජය කළ ස්වේච්ඡා බළසේනා සාමාජිකයන් තවත් වරෙක, සමාජීය අවශ්‍යතාවන් සඳහා වූ මෙහෙය ද, දේශය ගොඩනැංවීම පිණිස වූ සංවර්ධන කාර්යයන්ට ලබා දෙන්නා වූ අසමසම දායකත්වයද සාඩම්බරයෙන් යුතුව සිහිපත් කල යුතුව ඇත. එසේම අද වන විට ස්වේච්ඡා බළසේනාව තවදුරටත් ශක්තිමත් කරලමින් ස්වේච්ඡා උපසේවයද පණගන්වා ඇත. ඒ යටතේ විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විද්වත් වෘත්තිකයින් ඉඳුරාම බඳවා ගනිමින් යුද්ධ හමුදාවේත් රටේත් අභිවෘද්ධිය පිණිස යොදවා ඇති බැව් විශේෂයෙන් සඳහන් කළ හැකිය.

සාඩම්බර ඉතිහාසයක් ඇති ස්වේච්ඡා බළසේනාවේ සංවත්සර දිනය ඉතා අභිමානවත් අයුරින් සෑම වසරකම සැමරුවද එම යුද්ධ හමුදා චාරිත්‍ර ඉටු කිරීමට පසුගිය වසරේදී අප හට නොහැකි වූයේ ඒ වන විට අප රටට පමණක් නොව මුලු මහත් ලෝකයටම මුහුණ පෑමට සිදුවූ මාරාන්තික වසංගත

තත්වය හේතුවෙන් බවත් එය ඔබ සියලු දෙනාටම විශේෂයෙන් අවබෝධ කර දියයුතු කරුණක් නොවන බවත් මේ මොහොතේ ප්‍රකාශ කරමි. මෙම වසරේදීද ඒ සඳහා පනවා ඇති සීමාවන් තුළ හිඳිමින් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් යටතේ චාම්ව හා ගාම්භීරත්වයෙන් යුතු අයුරින් එකසිය හතලිස් වන සංවත්සරය සැමරීම සිදුකරනු ලබයි.

ස්වේච්ඡා සාමාජිකයෙක් යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම පරාර්ථයටම කැපවූ අයෙකි. එවැනි සාමාජිකයන්ගෙන් පරිපූර්ණ වී ඇති ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජියන් හට මෙම අවස්ථාවේදී ඉටු කිරීමට වගකීම් රාශියක් ඇත. සමස්ත ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් පවතින කොරෝනා වසංගතයේ බලපෑමට අපගේ මාතෘ භූමියද ලක්ව ඇති මේ මොහොතේ ඔබ සියලු දෙනා පුද්ගලිකවම මේ පිළිබඳ අවධානය යොමුකර මෙම මාරාන්තික වසංගතයෙන් මිදීමට හා අන් අය ඉන් මුදවා ගැනීමට ගත යුතු සියලු ආරක්ෂක ක්‍රියාමාර්ග ඉටුකිරීමට වගකීමෙන් බැඳී සිටිය යුතුවේ.

මේ වන විටත් ආරක්ෂක සාමාජිකයන් වූ ඔබ මෙම ව්‍යසනකාරී තත්වය මැඩපැවැත්වීම සඳහා ක්‍රියා කරමින් සිටින බව මා හොඳින් දන්නා කරුණකි. එය තවදුරටත් ක්‍රියාවට නංවා සිය පුද්ගලික වගකීම් සහ යුතුකම් අපගේ මාතෘභූමිය වෙනුවෙන් ඉටු කරන ලෙස ඉල්ලා සිටින අතර, එය ඔබ විසින් ඔබටත් ඔබගේ පවුලේ සාමාජිකයන්ටත් මුලු මහත් ජාතියටත් කරනු ලබන යුතුකමකි. ඒ නිසා කඳවුරු තුළ රාජකාරී ඉටුකරනු ලබන ඔබත් නිවසෙහි මේ වන විට නිවාඩු මත සිටින අනෙකුත් සාමාජිකයන් හටත් රජය විසින් හා සෞඛ්‍ය අංශ විසින්ද යුද්ධ හමුදා මූලස්ථානය වෙතින්ද ලබා දෙනු ලබන උපදෙස් ඒ ආකාරයෙන්ම පිළිපදිමින් මෙම ව්‍යසනකාරී තත්වයෙන් මිදීමට සක්‍රීය දායකත්වය ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි. එසේම විවිධ හැකියාවලින් පරිපූර්ණ දක්ෂ පුද්ගලයින් රැසක් සිටින ස්වේච්ඡා බළසේනාවේ ඒ සුවිශේෂී හැකියාවන් සමස්ත යුද්ධ හමුදාවටත් රටටත් ලබා දීමට හැකි පරිසරය ගොඩනැංවීම විවිධ මට්ටම්වල සිටින සියලු නායකයින්ගේ වගකීමක් බව මා මේ මොහොතේ සිහිපත් කර සිටිමි.

ස්වේච්ඡා බළසේනාවේ සාමාජිකයින් වශයෙන් අප සැමගේ පුහුණුවීම් යාවත්කාලීන කිරීමෙන් අපගේ යුද්ධ හමුදා දැණුම නිරන්තරයෙන් වර්ධනය කර ගැනීමත් ශාරීරික යෝග්‍යතාවය මනාව පවත්වාගෙන යාමත් අත්‍යවශ්‍ය කරුණකි. එය සාක්ෂාත් කර ගැනීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී තම සමාජ මෙහෙවර ඉටුකිරීමට අවශ්‍ය පුහුණුව, පන්නරය හා ධෛර්යය වර්ධනය කර ගැනීමට අදිටන් කර ගත යුතු බව සිහිපත් කරමි.

මෙවර යෙදෙන සංවත්සර දිනයේදී මේ දක්වා ස්වේච්ඡා බළසේනාවේ උන්නතිය උදෙසා විශාල මෙහෙවරක් කළ හිටපු සේනාවිධායකවරුන් මෙන්ම නියෝජ්‍ය සේනාවිධායකවරුන් ඇතුලු සියලුම සාමාජිකයන් මේ අවස්ථාවේදී ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමි. තවද ලෝක සාමය උදෙසා පළවන සහ දෙවන ලෝක යුද්ධවලදී ලක්මාතාව වෙනුවෙන් තම දිවි කැපකළ සියලු ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම පසුගිය තිස් වසර පුරා පැවති යුද්ධයෙන් රණක්ෂිතයට පත්ව ඇති සියලු රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්නටද මෙය අවස්ථාවක් කරගනිමි. තවද වර්තමානයේදී රාජකාරීන් හි නියුතු ඔබ සැමටත් ඔබගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ටත් සිවිල් සේවක මහත්ම මහත්මීන්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් නිදුක් නීරෝගිභාවය සහිත වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

ජවය සපිරි විනයගරුක බළසේනාවක් ලෙස යුද්ධ හමුදාවටද සවියක් වෙමින් දේශයට ගෞරවයක් අත්කර දෙමින් ඉදිරියටත් කටයුතු කරන්නට යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සියලු සාමාජිකයන් හට ශක්තිය ධෛර්යය, වාසනාව ලැබේවායි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

2021 අප්‍රේල් මස 01 දින

කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී
මේජර් ජෙනරාල්
සේනාවිධායක ශ්‍රීලංයුහසෙව්බ

# 140 වන සංවත්සරය
# අභිමානයෙන් සැමරේ...





වර්ෂ 1881 ක් වූ අප්‍රේල් මස 01 වන දින ශ්‍රී ලාංකිකයන් හා සුදු ජාතීන්ගේ එකතුවෙන් “සිලෝන් වොලන්ටියර්ස්” නමින් ආරම්භ කරන ලද ස්වේච්ජා හමුදාව මේ වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව නමින් අභිමානවත් මෙන්ම ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියමින් සිය 140 වෙනි සංවත්සරය අප්‍රේල් 01 වන දින අභිමානවත්ව සමරන ලදී.

ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් යුද්ධ හමුදා චාරිත්‍රානුකූලව සමරන ලද එම සංවත්සර කටයුතු අතර, ප්‍රථමයෙන්ම මාර්තු මස 30 වන දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වා ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජිකයන්ට සෙත් ප්‍රාර්ථනා කරන ලදී.









31 වන දින උදෑසන මහා සංඝ රත්නය උදෙසා සංඝගත දක්ෂිණාමය පිංකමක් සිදුකර රට වෙනුවෙන් ජීවිතය පූජා කළ සියලුම රණවිරුවන්ට පින් අනුමෝදන් කිරීමේ පිංකමක් සිදුකරන ලදි.





සංවත්සර දිනය වෙනුවෙන් මාර්තු මස 31 වන දින සර්ව ආගමික වතාවත් සිදු කිරීම.





සංවත්සර දින වැඩසටහන් අතරට පහත්ගම "සැඳෑ සෙවණ" වැඩිහිටි නිවාසය සුද්ද පවිත්‍ර කර එහි සියලුම වැඩිහිටියන් වෙත දිවා ආහාරය මෙන්ම අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් පරිත්‍යාග කිරීමක්ද අවිස්සාවේල්ල "සර්වෝදය සුවසෙත" ළමා නිවාසයේ සියලු දරු දැරියන් හට දිවා ආහාරය සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් පිරිනැමීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක්ද ක්‍රියාත්මක කරන ලදී.









සංවත්සර දිනය නිමිත්තෙන් පවත්වනු ලැබූ සියලු නිල දිවා භෝජන සංග්‍රහය අප්‍රේල් මස 01 වන දින සේනාවිධායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් ස්වේච්ඡා බළසේනා මූලස්ථාන සෙසුනිල භෝජනාගාරයේදී සිදුකරන ලදි.



140 වන සංවත්සරය නිමිත්තෙන් ස්වේච්ඡා බළසේනාවට අයත් සෙසුනිලයන් 1,625 කට නිල උසස්වීම් ලබා දීම ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන් විසින් සිදු කරනු ලැබූ අතර, එහි සංකේතාත්මක නිල පැළඳවීම සේනාවිධායක කාර්යාලය තුළදී සිදුකරන ලදි.



නගා රණගොස දමා ජය ධජ
සතුරු බල බිඳී සෙබළුනේ
හෙළා දා බිඳු ගලා රුහිරය
පොළෝ තලයයි නැහැවුණේ
පොළොව දෙදරා යෝධ බලගෙන
මතුවූ එඩිතර හෙළයිනේ
සියක් සතලිස් වසක අභිමන
බැතින් සමරන අද දිනේ
අහස ගුගුරා වැටෙන මල් වැහි
ඔබ නමටමයි විරුවනේ ....



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සාමාජිකයන් ලෙස රාජකාරි ඉටුකරමින් මාතෘභූමියේ නිදහස වෙනුවෙන් දිවි කැපකළ සියලුම රණවිරුවන් සිහිකරමින් ස්වේච්ඡා බළසේනා 140 වන සංවත්සරය නිමිත්තෙන් අප්‍රේල් මස 01 වන දින නව කඳවුරු භූමියේ ස්ථාපිත කරන ලද රණවිරු ස්මාරක අනුරුව වෙත වත්මන් සේනාවිධායකතුමන් විසින් පුෂ්පෝපහාර දක්වමින් සිය ආචාරය පුදකරන ලද අවස්ථාව.





140 වන සංවත්සරය වෙනුවෙන් ස්වේච්ඡා බළසේනා සේනාවියකතුමන් වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලියේ විශේෂිත අවස්ථා.





# 140 වන සංවත්සරයට යුද්ධ හමුදාධිපතිතුමාගේ සුබ පැතුම් ....



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වන සංවත්සරය වෙනුවෙන් වූ ස්වේච්ඡා බළසේනා නිලධාරි රාත්‍රී භෝජන සංග්‍රහය අප්‍රේල් මස 08 වන දින අවිස්සාවේල්ල සීතාවක රිජෙන්සි හෝටලයේදී පවත්වන ලදී. ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපීගේ ආරාධනයෙන් එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සමග යුද්ධ හමුදා සේවා වනිතා ගරු සභාපතිණී සුජීවා නෙල්සන් මැතිණියද එක්වූහ.











මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ඇතුළු යුද්ධ හමුදා මූලස්ථානයේ මූලික මාණ්ඩලික නිලධාරිවරුන්ද ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම එම මැතිණියන්ද, ස්වේච්ඡා බළසේනාවට අයත් ජ්‍යෙෂ්ඨ/ කණිෂ්ඨ නිලධාරීන් සහ නිලධාරිණියන් පිරිසක් සහභාගි වූහ.






ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වන සංවත්සරය නිමිත්තෙන් අප්‍රේල් මස 01 වන දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන් සමගින් සමූහ ඡායාරූපයකට පෙනීසිටි අවස්ථාව.




ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වන සංවත්සරය නිමිත්තෙන් අප්‍රේල් මස 08 වන දින පවත්වන ලද නිලධාරි රාත්‍රී භෝජන සංග්‍රහයේදී යුද්ධ හමුදාධිපතිතුමන් සමගින් සමූහ ඡායාරූපයකට පෙනීසිටි අවස්ථාව.

# බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ රාත්‍රී භෝජන සංග්‍රහය....



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වන සංවත්සරය වෙනුවෙන් ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයේ රාත්‍රී භෝජන සංග්‍රහයක් අප්‍රේල් මස 06 වන දින ස්වේච්ඡා බළසේනා මුලස්ථාන බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයේදී පවත්වන ලදී.



ස්වේච්ඡා බළසේනා මුලස්ථාන බළලත් නිලධාරි ලෙස කටයුතු කරනු ලබන බනි 1 ජේ එම් දිසානායකගේ ආරාධනයෙන් එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි වූ අතර, එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, මූලික මාණ්ඩලික නිලධාරි ඇතුළු අංශ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගි වූහ.









ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 140 වන සංවත්සරය නිමිත්තෙන් අප්‍රේල් මස 06 වන දින පවත්වන ලද
බළලත් නිලධාරි හා සැරයන් නිවස්න රාත්‍රී භෝජන සංග්‍රහයේදී ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන් සමගින් සමූහ ඡායාරූපයකට පෙනීසිටි අවස්ථාව.

## ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

## අධීක්ෂණය



මේජර් ජෙනරාල්
ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී

## උපදේශකත්වය



බ්‍රිගේඩියර්
එස් එන් සමරවික්‍රම කේඑස්පී



කර්නල්
යූ කේ වික්‍රමාරච්චි

## සංස්කාරක



ලුතිනන් කර්නල්
එස් රාජපක්ෂ ශ්‍රීලංජාආබමු

## “රණවරුණ” කාර්ය මණ්ඩලය

මේජර් ජේ පී ටීඑස් ජයසිංහ ශ්‍රීලංජාආබමු (සම්බණ්ධීකරණය)
කපිතාන් ඩී එම් දිල්හාරා සජීවනී ජාශීබ (සෝදුපත් කියවීම)

සැරයන් දයාරත්න ඩීජීඑස් (පිටු සැකසුම)
කෝප්‍රල් කීර්තිරත්න ඒඑච්ටීඑස්එස් (පරිගණක නිමැවුම්)

ලා/කෝප්‍රල් කරුණාතිලක ඒඑම් (ඡායාරූප)
ලා/කෝප්‍රල් තෙවරප්පෙරුම අයියූ (ඡායාරූප)

## රණවරුණ ලිපිනය

සංස්කාරක,
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද්ධ හමුදා කඳවුර, සාලාව - කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com
වෙබ් slavf@army.lk
දුරකථන - 036 2255 362 / ෆැක්ස් - 036 2255 709

**මුද්‍රණය නියෝ ග්‍රැෆික්ස්**


# සංස්කාරක සටහන

හොඳම දේ දරුවන්ටය යන වියත් කියමනට අනුව දරුවන් වෙනුවෙන් ඇපකැප වී සිය ජීවිත සාර්ථක කිරීම, අප සියලු දෙනාගේ පොදු වගකීමකි. ඒ අතරින් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම සමස්ත සමාජයේම යුතුකමකි. කෙසේ වෙතත් පෙර පාසැල්, පාසැල් හෝ උසස් අධ්‍යාපන යන අධ්‍යාපනය ප්‍රමුඛතම කාර්යය කරගත් ආයතනයන් සියල්ල පවතින කොරෝනා වෛරස තත්වය යටතේ වුවද පරිගණක හෝ ස්මාර්ට් ජංගම දුරකථන ආශ්‍රිතව ඔන්ලයින් පංති ඔස්සේ කෙසේ හෝ අධ්‍යයන කටයුතුවල නිරතවීම යම් ආකාරයක අස්වැසිල්ලකි.

එසේ වුවත් වර්තමානයේ අපට අසන්නට දකින්නට ලැබෙන ගැටළුවක් වී ඇත්තේ දරුවන් දවසේ වැඩි කාලයක් අන්තර්ජාලය භාවිත කිරීම නිසා විවිධ පරිගණක උපාංග භාවිතයට පෙළඹීමයි. එම හේතුවෙන් විවිධ පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහිවීම, කණ්ඩායමක් ලෙස එම ක්‍රීඩාවල නිරතවීම, නොගැළපෙන වීඩියෝ දර්ශන නැරඹීම ආදියත් සමග උද්ගත වී තිබෙන තත්වය අතිශය කණගාටුදායකය. මන්දයත් පාසැල් විවෘත නොවූ කාලපරිච්ඡේදය තුළ ළමා මනසට පරිගණක උපාංග භාවිතය ආශ්‍රිතව සිදුවී ඇති බලපෑම සුවිශාලබව බොහෝ විද්වතුන්ගේ මතය බැවිනි. එනම් ස්නායු විශේෂඥයින් දක්වන පරිදි එක දිගට පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතවීම මගින් දරුවන්ගේ ඇස්වලට හානි වන අතර මොළයේ ස්නායු පද්ධතියටද සිදුවන හානිය බරපතල බවයි. ඒ නිසාම දරුවන් පසුකාලීනව ස්නායු ආබාධිත තත්වයට පත්විය හැකි අතර මෑතකාලීනව ලංකාවේ උසස්පෙළ වයසේ පසුවන දරුවන් කිහිප දෙනෙකුට පරිගණක ආශ්‍රිතව මොළයට හානි සිදු වූ අවස්ථාද දැකගත හැකිවිය.

එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියට අනුව අධ්‍යාපනය මූලික ළමා අයිතිවාසිකමක් වනවා සේම දෙමාපිය වැඩිහිටි ප්‍රජාව ඒ සඳහා අවශ්‍ය පහසුකම් මෙන්ම මඟපෙන්වීම කළ යුතුවේ. එහෙත් එම කාර්යයේදී දරුවන්ගේ ජීවිතවලට සෘණාත්මක බලපෑමක් එල්ල වේ නම් එහි බලපෑමද වැඩිහිටියන් වූ අපම භාරගත යුතුය. වැඩිහිටියන් බොහොමයක් දෙනා රැකියා සඳහා පිටත්ව යන අතර දරුවන්ගේ අධ්‍යාපන අවස්ථාව උදෙසා පරිගණකයක් හෝ ස්මාර්ට් ජංගම දුරකථනයක් දරුවන් වෙත ලබාදී නිවෙසින් පිටත්ව යාමට දෙමාපියන්ට සිදුවී ඇත. ඒ නිසාම මෙම ක්‍රියාදාමය දැලි පිහියෙන් කිරි කෑමක් වැනි බරපතල කාර්යයකි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වැඩිම සාමාජික පිරිසකගෙන් සංයුක්ත වූ විශාලතම සංවිධාන ව්‍යුහය වන යුද්ධ හමුදාවේ සාමාජිකයන් වන අප අතරින් බහුතරයක් දෙමාපියන් වන අතර තම දරුවන් පිළිබඳව අවධානයෙන් පසුවිය යුතු කාලපරිච්ඡේදයක් වර්තමානය වන විට එළඹ තිබේ. එනම් කායික මෙන්ම මානසික නිරෝගීභාවයෙන් යුක්ත දරු පිරිසක් සමාජයට දායාද කිරීමේ සුවිශේෂී වගකීම සොල්දාදුවන් වූ අප සැමවෙතද පැවරී තිබේ. කවර අභියෝගයකට වුවද සාර්ථකව මුහුණ දීමේ ශක්තිය ඇති යුද්ධ හමුදා සාමාජිකයින් ලෙස අපගේ මෙන්ම අප හා සම්බන්ධ වන දරු පිරිස පිළිබඳව වැඩි අවධානයකින් කටයුතු කිරීම වැදගත්ය. එවිට වර්තමාන බාලපරම්පරාවේ සාර්ථක අඩිතාලම තුළින් අනාගත ශ්‍රී ලංකාවේ දියුණුව පිළිබඳ නැවුම් බලාපොරොත්තු තබා ගැනීමට අපටද හැකිවනු නොඅනුමානය.



# නික්ම ගිය සේනාවිධායකට ස්වේච්ඡා බළසේනාවේ උත්තමාචාරය ....

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 44 වන සේනාවිධායක ලෙස රාජකාරී ඉටුකළ මේජර් ජෙනරාල් ජේ එම් යූ ඩී ජයසිංහ ඉකුත් පෙබරවාරි මස 25 වන දින සිය ධූරයෙන් සමුගන්නා ලදී.

එතුමන් රාජකාරි කළ ඉතා කෙටි කාලසීමාව තුළ වුවද ස්වේච්ඡා බළසේනාවේ මෙන්ම ස්වේච්ඡා සාමපික සාමාපිකාවන්න්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ඉටුකරනු ලැබූ අනගිභවනීය මෙහෙවර සිහිපත් කරමින් ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාපිකයන්ගේ සුභාශිංසනය "රණවරුණ" ඔස්සේ මෙසේ පිරිනමන්නෙමු.







# No Army is better than its soldiers ...



ස්වේච්ඡා බළසේනාවට අයත් සියලු ස්වේච්ඡා ඒකකවල අණදෙන නිලධාරීන්, රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිලධාරීවරුන් හට **"No Army is better than its soldiers"** නමින් හරවත් මෙන්ම කාලීන දේශනයක් වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් මාර්තු මස 19 වන දින ස්වේච්ඡා බළසේනා මූලස්ථාන දේශන ශාලාවේදී පවත්වන ලදී. එම දේශනයෙන් පසු සේනාවිධායකතුමන්ගේ ආකල්ප මෙන්ම ඉදිරි සැලසුම් පිළිබඳව තත් නිලධාරීන් දැනුවත් කරමින් ඒකකයන් හී පවතින පාලනමය ගැටළු පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වූ අතර, අණදෙන නිලධාරීවරුන් වශයෙන් රාජකාරි ඉටු කිරීමේදී මුහුණපෑමට සිදුවන විවිධ ගැටළු මෙන්ම ඒකකයන්හී පවතින රාජකාරීමය ගැටළු විසඳා ගැනීමට අණදෙන නිලධාරීවරුන්ට එම සාකච්ඡාව මගින් අවස්ථාවක් උදාවිය.



# ලියෝ සමාජයෙන් පරිත්‍යාගයක් ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සාමාජිකයින් වෙනුවෙන් රෝද පුටු 03 ක් සහ ස්වේච්ඡා බළසේනා මූලස්ථාන පරිශ්‍රයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍රයක්, ජල පිරිපහදු යන්ත්‍රයක් හා කොරෝනා රෝගයෙන් ආරක්ෂාවීම වෙනුවෙන් දෑත් පිරිසිදුකාරක දියර මෙන්ම මුඛ ආවර්ණ තොගයක් ලියෝ 306 C 1 සමාජය වෙතින් ස්වේච්ඡා බළසේනා මූලස්ථානය වෙත පසුගියදා පරිත්‍යාග කරන ලදි. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී, නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේ ඩී සී පී ජයසිංහ කේඑස්වී කේඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ලියෝ සමාජයේ සාමාජික සාමාජිකාවන් පිරිසක්ද එක්වූහ. මෙය ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කර්නල් භකාස කර්නල් එන් මහවිතාන කේඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සම්බන්ධීකරණ දායකත්වයෙන් සිදුවිය.



# ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලේ ප්‍රථම සංචාරය ....



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා වත්මන් සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලෙහි මාර්තු මස 26 වන දින නිල සංචාරයක නිරතවන ලදී. ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් එච් ඒ කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී විසින් ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන් පිළිගන්නා ලදී. ඉන් අනතුරුව පුහුණු පාසැල් කාර්ය මණ්ඩලය ඇමතු එතුමන් එහි පුහුණු කටයුතු මෙන්ම පාලන රාජකාරි පිළිබඳ විමර්ශනය කළ අතර පුහුණු පාසලේ සේනාවිධායක වෙත නිසි උපදෙස් ලබාදීමෙන් පසු එම සංචාරය සිහිවීම පිණිස පැළයක්ද රෝපණය කළ එතුමන් සමරු පොතේ සටහනක්ද තබමින් එම සංචාරයේ නිමාව සනිටුහන් කරන ලදි.

# 2 [සේවි] ශ්‍රීලපාහ සංචාරය ....

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිපී පසුගියදා ස්වේච්ඡා බළසේනාවට අයත් පැරණිතම ස්වේච්ඡා ඒකකය වන 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ කඳවුරු නිරීක්ෂණ සංචාරයක නිරතවන ලදි. එහිදී සේනාවිධායකතුමන් විසින් ඒකක හටපිරිස් ආමන්ත්‍රණය කරන ලද අතර, ඒකකයට පැවරී ඇති රාජකාරීන් හා පාලන කටයුතු පිළිබඳවද සොයා බලන ලදි.





# උපකරණ පාලක නිලධාරීන් ලෙස විසිර ගියදා ...







උපකරණ පාලක නිලධාරි පාඨමාළා අංක 23 යටතේ සාර්ථකව පුහුණුව අවසන්කළ නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවන්ට අයත් උපකරණ පාලක නිලධාරීන් 31 දෙනෙකුගේ විසිර යෑමේ පෙළපාලිය මාර්තු මස 10 වන දින ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල දියතලාව හීදී පැවැත්විණ.

ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් එච් ඒ කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සීගේ ආරාධනයෙන් විසිරයෑමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආඥාපති යුද්ධ හමුදා පුහුණු අණසක හා යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙපිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස් එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි විය.



# තුරුණු පුතුන්ගේ අභිමානය උපන් දැයට...



වසර 118 ක් වැනි දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල දියතලාව වෙතින් තවත් විරෝදාර රණවිරුවන් 188 දෙනෙකු මාර්තු මස 23 වන දින ලක් මාතාවට දායාද කරන ලදි. මෙය 2020 නොවැම්බර් මස 23 වන දින සිට 2021 මාර්තු මස 23 වන දින දක්වා ආධුණික පුහුණු පාඨමාලා අංක 79 යටතේ සිදුකරනු ලැබීය. පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් එච් ඒ කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් එහි විසිරයෑමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආසේමු (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එන් ආර් ළමාහේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ එක්විය.



පාඨමාලා අංක 79 හී සෑම අතින්ම අතිශූර සෙබළාට හිමි සම්මානය ආ/සෙ බණ්ඩාර පීජීසීපී විසින්ද, හොඳම ශාරීරික යෝග්‍ය සෙබළාට හිමි සම්මානය ආ/සෙ නිම්සර එම් එන් විසින්ද, හොඳම වෙඩි තබන්නාට හිමි සම්මානය ආ/සෙ සංකල්ප කේ ඩී විසින්ද හිමිකර ගත්හ.









## ගැබිණි මාතාවන්ට සත්කාරයක් ...

7 (සේවි) ගරෙ



යාපනය විඩත්තපලෙයි ප්‍රදේශයේ ස්ථාපිත 7 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ 30 වන සංවත්සරය නිමිත්තෙන් අණදෙන නිලධාරි ඩබ්ලිව් එස් අයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ඇතුළු ඒකක සාමාජිකයින්ගේ දායකත්වයෙන් ඒකක බළප්‍රදේශයේ ජීවත්වන දමිළ ගැබිණි මාතාවන් 30 දෙනෙකු වෙත රු:57000.00 ක පමණ මූල්‍ය වටිනාකමින් යුතු උපකරණ හා පැළ බෙදාදිමක් පසුගිය ජනවාරි මස 01 වන දින කෙත්පේලි පවුල් සෞඛ්‍ය සේවා කාර්යාලයේදි සිදුකරන ලදි. මෙය 52 වන පාබල සේනාංකාධිපති හා 522 වන බළසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, පවුල් සෞඛ්‍ය සේවිකාවන් ඇතුළු ප්‍රදේශවාසින් පිරිසක් සහභාගි වූහ.

## සැදැහැ සිතින් ඉදිවූ පින්බිමක් ...

13 ශ්‍රීලංජාආබමු



මුලතිව් මුතියන්කඩ්ඩුකුලම් ප්‍රදේශයේ ස්ථාපිත 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළඇණියේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩී එම් එස් දිසානායක යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි ඇතළු ඒකක සාමාජිකයන්ගේ මුල්‍යමය හා ශ්‍රමදායකත්වයෙන් ශ්‍රී ප්‍රාර්ථනා බෝධි විහාරය, මකර තොරණ හා ඝණ්ඨා කුළුණ ඇතුලු අටවිසි බුද්ධ ප්‍රතිමා වහන්සේලා ඉදිකර පසුගිය පෙබරවාරි මස 20 වන දින මහා සංඝ රත්නය වැඩමවා අලංකාර පෙරහැරකින් යුක්තව බුදු සසුනට පුජා කරන ලදි.

## වයෝවෘද්ධ මාතාවට නව නිවසක් ...

6 ශ්‍රීලංජාආබමු



මුලතිව් පුදුමාතලන් ප්‍රදේශයේ සථාපිත 6 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු අණදෙන නිලධාරීගේ මගපෙන්වීම යටතේ ඒකක සාමපිකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඒකක බළප්‍රදේශයේ මලිගතිව් ග්‍රාමසේවා වසමේ පදිංචි වයෝවෘද්ධ කාන්තාවක් වන සෙම්බකුට්ටි පාක්‍යම් මාතාව වෙත අංගසම්පුර්ණ නව නිවසක් තනා පසුගිය තෛපොංගල් දිනයට සමගාමීව ජනවාරි මස 14 වන දිනට යෙදුණ සුබ මොහොතින් ඇය වෙත පවරාදීම සිදුවූයේ මුලතිව් ආරක්ෂක සේනා ආඥාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙනි. මේ සඳහා සේනාංකාධිපති, බළසේනාධිපතිවරුන්, 68 වන සේනාංකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අණදෙන නිලධාරි ඇතුළු ඒකක සාමාජිකයින්, ප්‍රාදේශීය ලේකම්, පුදුකුඩුඉරිප්පු දේවස්ථාන පියතුමන් ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.

# සොළොස් වසක අභිමන සමරමින් ...



4 (සෙව්) ශ්‍රීලයුයුබ



4(සෙව්) ශ්‍රීලයුයුබ සිය ඒකකයේ 14 වන සංවත්සරය පසුගිය ජනවාරි මස 09 වන දින අභිමානවත් ලෙස ඒකක මූලස්ථානයේදී සමරන ලදි. එදින ඒකක බුදුමැදුර අබියස බෝධි පූජා පිංකමක් පැවැත් වූ අතර ඒකකයේ සියලු සාමාජිකයින්ගේ ශ්‍රමදායකත්වයෙන් ඉදි වූ රෙජිමේන්තු පොලිස් අංශය සහ සිවිල් සේවක නිවස්නය ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව් එම් එස් එම් බී වන්සේකර ඒඩීටීඕ - ශ්‍රීලයුයුබ යන ජ්‍යේෂ්ඨ නිලධාරීගේ සුරතින් විවෘත විය. 2020 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් ඒකක සාමාජිකයින්ගේ දු දරුවන් වෙත පොත් හා පාසැල් උපකරණ පිරිනැමීමක්ද ඒකකය තුළ ලේ දන්දීමේ වැඩසටහනක්ද එදිනට සමගාමීව සංවිධානය කරන ලදි.

## හිසට සෙවණක්

9 (සෙව්) ශ්‍රීලපාහ



වරිතවිලාන් ප්‍රදේශයේ ස්ථානගත 9 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකය විසින් ඒකක බළප්‍රදේශය තුළ ජිවත්වන අඩුආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය යටතේ උඩුවිල් දකුණ මානිපායි ප්‍රදේශයේ පදිංචි ඩෙසී ඉන්ද්‍රා මහත්මියට නවනිවසක් ඉදිකර එම පවුල වෙත භාරදීම පසුගියදා ආසේමු (යාපනය) ආඥාපති තුමන්ගේ සුරතින් සිදුකරන ලදි. මෙම සත්කාරය සිදු කිරීම වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරීගේ මෙහයවීමෙන් එම ඒකක සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වය මත සිදුකළ අතර, මේ සඳහා කුමා වීරසූරිය මහතාගේ මූල්‍යමය දායකත්වය හිමිවිය.

15 (සේවා) ශ්‍රීලංසිරෙ



# රෙජිමේන්තු අධිපතිගේ සංචාරය ....



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මෙන්ම ආසේවූ (වන්නි) ආඥාපති වශයෙන් රාජකාරී කරනු ලබන මේජර් ජෙනරාල් ඩී එම් එච් ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පසුගිය ජනවාරි මස 07 වන දින වව්නියාව ප්‍රදේශයේ ස්ථානගත 15 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිරීක්ෂණ සංචාරයක නිරත විය. එහිදී කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ඒකක අණදෙන නිලධාරී විසින් රෙජිමේන්තු අධිපතිතුමන්ව පිළිගනු ලැබූ අතර, ඒකකයේ වත්මන් තත්වය සහ පාලන කටයුතු පිළිබඳ සොයා බැලූ එතුමන් අණදෙන නිලධාරීහට නිසි උපදෙස් ලබාදීමෙන් අනතුරුව අඹ පැළයක්ද රෝපණය කරමින් එම සංචාරය සනිටුහන් කරන ලදි.

රයිෆල් බළකාය

# සම්බන්ධීකරණ කාර්යාල ගොඩනැගිල්ලක්..

ශ්‍රී ලංකා රයිෆල් බළකායේ 1 වන හා 2 වන ඒකක ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා රයිෆල් බළකාය ලෙස නැවත නගාසිටුවීම, පසුගිය පෙබරවාරි මස 15 වන දින සිදුවිය. පල්ලෙකැලේ කුණ්ඩසාලේ ප්‍රදේශයේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා රයිෆල් බළකායේ රෙජිමේන්තු මධ්‍යස්ථාන සම්බන්ධීකරණ කාර්යාලය විවෘත කිරීම රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරී කර්නල් අයි ඩී ඩී ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් සිදුවිය.



# බළසේනාධිපතිගේ ප්‍රථම සංචාරය ....

15 ශ්‍රීලංජාආබමු



511 පාබල බළසේනාවේ නව බළසේනාධිපති කර්නල් පී එන් එස් ජේ ප්‍රනාන්දු යූඑස්පී සිය තනතුරෙහි රාජකාරී භාරගැනීමෙන් පසු ජනවාරි මස 20 වන දින 15 වන ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ පළමු නිල සංචාරය සිදුකරන ලදි. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් එස් යූ ඩබ්ලිව් විමලරත්න විසින් එතුමන්ව උණුසුම්ව පිළිගන්නා ලද අතර, ඒකක සෙබළුන් විසින් මුර පිරික්සුමක් පිරිනමන ලදි. ඉන් අනතුරුව අණදෙන නිලධාරී විසින් ඒකකයේ රාජකාරී පිළිබඳව එතුමන් දැනුවත් කළ අතර, පසුව ඒකකයේ ක්‍රියාන්විත හා පාලනමය රාජකාරී පිළිබඳ අවධානය යොමු කරමින් ඒකක හට පිරිස් ආමන්ත්‍රණය කළ එතුමන් එම සංචාරය සනිටුහන් කිරීම වස් කඳවුරු පරිශ්‍රයේ අඹ පැළයක්ද රෝපණය කර නික්ම යන ලදි.

7 (සෙව්) ගරෙ



# දරුවනට අතහිත ...

හෙට දවසේ ලොව ජය ගන්නා සිංහල, දමිළ, මුස්ලිම් දරුවන් සියලු දෙනාම රටේ අනාගතය භාරගැනීමට සිටින දරුවන්ය. යන අරමුණ පෙරදැරිව පසුගිය මාර්තු මස 28 වන දිනට යෙදී තිබුණු පසළොස්වක පොහෝ දිනය නිමිත්තෙන් 7(සෙව්) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව් එස් අයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ගේ සංකල්පයක් මත යාපන අර්ධද්වීපයේ මිරුසුවිල් ජේ/336 ග්‍රාමසේවා වසමේ පිහිටා ඇති හෝලි පවුලේ ළමානිවාසයේ සිටින ළමුන් 12 දෙනෙකු වෙත පාසල් උපකරණ සහ දෛනික අවශ්‍යතා පරිත්‍යාග කිරීමක් සිදුකරන ලදී. එහිදී එම ළමුන් උදෙසා දිවා ආහාරයද ලබා දීමට කටයුතු කරන ලද අතර එම අවස්ථාවට ළමා නිවාසයේ ප්‍රධාන පාලිකාව සහ සහයක පාලිකාවන්ද එක්වූහ.

15 (සෙව්) ගැහේබ





# නව ජලපෙරනයක්...

මන්නාරම් ප්‍රදේශයේ ස්ථානගත 15(සෙව්) ගැමුණු හේවා බළඇණියට අඩුපාඩුවක්ව පැවති ජලපෙරන යන්ත්‍රයක් 2021.03.03 වන දින ඒකක අණදෙන නිලධාරි මේජර් ඩී ඩී එස් ආර් එම් දුනුසිංහ ගැහේබ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින්, ඒකකයේ සියලුම සාමාජිකයන් හා සිවිල් සේවක මහතුන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කරන ලදි.

13 ශ්‍රීලංජාආබමු





# ඒකක සංචාරය ...

ඉදිරි නඩත්තු පෙදෙස - (මුලතිව්) හී වත්මන් ආඥාපති මේජර් ජෙනරාල් ආර් ගනේගොඩ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සිය රාජකාරි භාරගැනීමෙන් අනතුරුව 2021 මාර්තු මස 04 දින 643 වන බළසේනා මූලස්ථාන බළප්‍රදේශය යටතේ ඇති ඒකකයන්හී ප්‍රථම නිල සංචාරය සිදුකරන ලදි. එහිදී 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙනුවෙන් අණදෙන නිලධාරි තනතුරේ රාජකාරි ආවරණය කරනු ලබන මේජර් කේ එන් සී ද සිල්වා ශ්‍රීලංජාආබමු යන නිලධාරි විසින් ආඥාපතිතුමන්ව ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. එහිදී ආඥාපතිතුමන් විසින් ඒකකයේ වත්මන් තත්වය සහ ඒකකයේ පාලනමය අවශ්‍යතා පිළිබඳවද සොයා බලන ලදී.

## කඳවුරු නිරීක්ෂණ සංචාරය ....

**14 (සේවා) ශ්‍රීලපාහ**



ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි ආඥාපති මේජර් ජෙනරාල් ඩී එම් එච් ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සිය රාජකාරි භාරගැනීමෙන් පසු ප්‍රථම නිල කඳවුරු සංචාරය වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත 14 (සේවා) ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුරේ පසුගිය ජනවාරි මස 25 වන දින සිදුකරන ලදි. එහිදී ඒකක අණදෙන නිලධාරි විසින් එතුමන්ව පිළිගත් අතර, ඒකකයේ වත්මන් තත්වය මෙන්ම පවතින ගැටළු පිළිබඳව මෙහිදී සොයා බලන ලදි.

**13 ශ්‍රීලංජාආබමු**

## ඉටුකළ මෙහෙවරට ආචාර ...



මුලතිව් මුතියන්කඩ්ඩුකුලම් ප්‍රදේශයේ ස්ථාපිත 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩී එම් එස් දිසානායක යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019 පෙබරවාරි මස 22 දින සිට 2021 පෙබරවාරි මස 22 දින දක්වා ඒකක අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි ඉටුකර නික්මයාම වෙනුවෙන් හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයක් හා ආචාර පෙළපාලියක් ඒකකය වෙතින් පිළිගන්වන ලදි.

## දැණුම හා කැපවීම තුළින් මව්බිමට අභිමානය ...

## සිය දැණුම උපදේශනය වෙනුවෙන් ....



පසුගිය මාර්තු මස 26 වන දින පැවැති රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ දී ලුතිනන් කර්නල් ඩබ්ලිව් ඩී සී සී බී දිසානායක ගැහේබ (නි/4475) ජ්‍යෙෂ්ඨ නිලධාරී සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MasterofArtsinSociology)සාර්ථකව සම්පූර්ණකර ඇත. එමෙන්ම තත් නිලධාරි මීට ප්‍රථම රුහුණු විශ්වවිද්‍යාලය වෙතින් මනෝ විද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද (Diploma in Psychological & Counselling- University of Ruhuna) මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව වාණිජ කර්මාන්ත කෘෂිකර්ම මණ්ඩලය අනුරාධපුර වෙතින්ද, ආරක්ෂක කලමණාකරණ ඩිප්ලෝමාව (කණිෂ්ඨ මට්ටම) (Diploma in Junior Level Defence Management- University of Indor - INDIA) දේවි අහිලියා විශ්වවිද්‍යාලය ඉන්දෝර් - ඉන්දියාව වෙතින්ද, තම උසස් අධ්‍යාපන අවස්ථා සම්පූර්ණ කර ඇති අතර රුහුණු විශ්වවිද්‍යාලය වෙතින් දර්ශනපති උපාධිය (Mphil) සඳහාද තේරී පත්ව ඇත.

මේ වන විට මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදා මූලස්ථාන පුනුරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පවතින අභිමන්සල හී මනෝවිද්‍යා උපදේශන නිලධාරී වශයෙන් සිය රාජකාරිය ඉටු කරනු ලබයි. තමා ලබාගත් දැනුමෙන් යුද්ධ හමුදාවේ උපදේශනය අවශ්‍ය අයවළුන් වෙත උපදේශනය තුළින් විශිෂ්ඨ සේවයක් ලබාදීමට පෙරමන් බලාසිටින අතර සිය උසස් අධ්‍යාපනයට සේම යුද්ධ හමුදා දිවියට මෙන්ම පුද්ගලික ජීවිතයටද රණවරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන පිරිනමන්නෙමු.



# නිර්මාණ අසපුව ...

## කොරෝනා දුරු කරමු



අද දවසේ ක්‍රියාවන් තුළින්
හෙට දවස සුබදායක වනු ඇත.
ඔබ එනතුරු බොහෝ දෙනෙකු
මග බලා සිටින බව සිතන්න,
ජිවිතයෙහි යා යුතු දුර බොහෝ
බැව් සිතන්න
ඉලක්කයක් ඇති බැව් සිතන්න
ජිවිතය අවබෝධයෙන් සිතන්න
අපි අපේ ජිවිතයට ආදරය කරමු
ආදරණියයන් හට කඳුලක් නොදෙමු
කොරෝනා උවදුර දුරු කරමු

මා/සැරයන් පතිරන එම් ජී එන්
9 (සෙව්) ශ්‍රීලංඉසේරෙ
සඳහිරු සෑය

## මගෙ ලොව ඔබමයි පුතුනේ

සුවහසක් පැතුම් අතරේ
නිරතුරු මා දුටු සිහිනයයි
මගේ ලොවට පෑයු හිරු
ඔබය මගේ පුතුණුවනේ

ඔබ හසරැලි මුවග
නිරතුරුවම දිලුනේ
නිමක් නැති පැතුම්
මහද සතපනු දැනුනේ

කොතැනක සිටියද ලොවේ
ඔබේ රුව හදවතේ
නිරතුරුව සැරිසරන්නේ
මගෙ ලොව ඔබමයි පුතුනේ

ජිවිතේ මං තලාවේ
දහසකුත් බාධක මැදින්
නොපසුබටව යනු මැනේ
ජීවන මග සතුටිනේ

පෙර දිනක මැවු ලොවට
ළංවෙන්න මතු දිනේ
ඔබට ශක්තිය ලැබී
දිරි වඩන් ජීවිතයෙ

ගුණ දමින් යහගුණෙන්
නැණ පහන් දැල්විලා
දිවි පහන් ටැඹ පුරා
ජය කෙහෙළි නංවන්න

මව්පියන් ගුරු පෙමින්
ඔවදනින් දිරිමත්ව
මැදහත් වු සිතින් ලොව
ජයගන්න දිවි කතර

එස් එන් සමරවික්‍රම කේඑස්පී
බ්‍රිගේඩියර්
පුහුණු පරිකෂක ශ්‍රීලංයුහසෙව්බමූ

## අම්මා සහ කිරි අම්මා

අම්මා මෙන්ම සැමදා අප ළඟින් සිටි
ඉපදුන දවසේ සිට කැතකුණු අතගාපු
තම දරුවනට මෙන්ම අප හට පෙම් කරපු
ඇය කිරි අම්මයි මාගේ මවගෙද මව වූ

නිදිවරා සිටියි මා ඉපදුනු දිනයේ සිට
අම්මට සහය විය අප අඩනා කලට
ඇය තේරුම්ගනි අපගේ හැසිරීම
මවටද දොස්නගා අප ගනි ඇගෙ තුරුළටම

රන්කැටියා ලෙසින් අමතා අප සැමට
සෙනෙහස පායි දරු මුණුබුරුවන් සැමට
අප දියුණුව බලා සැනසුනි සැමදාම
කිරි අම්මා නොවෙයි ඇය මගේ අම්මාය

අම්මා සේම අප තැවුලකදී දුක් වෙයි කිරි අම්මාද
ලබනා ජයකදී වුවද වැඩියෙන් සතුටු වන්නෙත් ඒ දෙදෙනාය
දුක මිස සැපත් නොවිදති ඒ දෙදෙනාම
දෑතම එකතුකර වදිනෙමි මේ දෙදෙනට සැමදාම

සැරයන් දයාරත්න ඩීපීඑස්
ප්‍රකාශන අංශය
ශ්‍රීලංයුහසෙව්බමු



## ආවර්ජනා

රුපු බළ බින්ද හැටි මතකයි පා එඩිය
ආ මග සොඳුරු නැත බිහිසුණු වෙඩි හඬය
පවසට දිය බිඳක් ලැබුනම ජව වැඩිය
මෙහෙමයි දැම්මේ ලක්මෑණිට ජය කොඩිය

සුරංග සෙනවිරත්න
රණවරුන පාඨක




# හමුදා නිළධාරියෙකුගේ පුහුණුව තුළ ...

## 07 වන කොටස

කෑමබීම ගැන කියද්දී අපේ වනගත වියළි සලාක මල්ල ගැන නොකියාම බැරි ය. එහි මුලිකාංග යක් වු සැමන්,මැගී නූඩ්ල්ස් සහ ක්‍රීම් ක්‍රැකර් අශ්‍රිතව අප විසින් නිර්මාණය කරන ලද ආහාර වට්ටෝරු ලෝකයා අදටත් දන්නේ නැත. ඒවා එච්චරකට ජුගුප්සාජනක ය. උදාහරණයක් ලෙස මැගි නූඩ්ල්ස් පැකට්ටුවකට සැමන් ටින් එක කඩා දමා ක්‍රීම් කැකර් කෑලි වලට කඩා කලවම් කර පිසා ගෙන කන කෑම වට්ටෝරුවක් ගැන අදටත් කිසිම සූපවේදියකු හීනෙන් බය වූ වේලාවකවත් හිතන්නට නැත. ක්‍රීම් කැකර් සැමන් වතුරෙන් තැම්බුණු පසු  දැනෙන රසය තාත්වික ලෝකයේ කිසිම එකෙකු නපුරුම  හීනයක වත් කල්පනා කරන මාතෘකාවක් නොවීම එක අතකින් අරුමයක් නොවේ.

එනමුත් ඒ රළු පුහුණු පරිසරය තුළ ලැබෙන කෙටි විවේකයේ පුංචි ගිනිමැලයක් මත ඇලුමිනියම් කෑම පෙට්ටියක් තුළ පිසගන්නා ඒ අමුතු කෑම වේලේ දිව්‍යමය රසය අදටත් මොන හෝටලයේ මොනා කෑවත් දනවන්නට බැරිය. කොටින්ම ඒ රසට ලොල් වු අපේ සමහර එවුං පුහුණුව අවසන් වී විසිර යාමෙන් පසු උන්ගේ ඒකකවලදී ද ඒ වට්ටෝරුව උයාගෙන තනියෙන් කෑවැයි මා සමග පවසා ඇත. ලෝකයට නිරස වූවද අප වැනි මඩේ, ගොඩේ ලැග්ගවුන්හට එහි අමුතු රසයක් අතුවා වන්නට ඇත.

එතැනික් එහාට තේ කොළ පැකැට්ටුවෙන් දහසකුත් එකක් දුමාරගත ආශාවන් සංසිඳවා ගත් දුම්ලෝලින්ද ටැංගෝ, කෝල්මන්ස් පැකට්ටුවෙන් සහ සීනි ඩිංගෙන් එලිෆන්ට් හවුස් නිෂ්පාදන බිහිකළ එවුන්ද රටඉඳි රොටී හදා අනුභව කළ එවුන්ද වශයෙන් විවිධාකාර සූපවේදි සහ වෙනත් දක්ෂතා දැක්වුවන් අප අතර සුලබ විය. ඒ වන අභ්‍යාසය තුළ මුල් දින ගණනාවක කාලයක් එක් එක් පාඨමාලාවන්ට අයත් කණ්ඩායම් වශයෙන් වනයේ විවිධ අහමුලුවල කඳවුරු ලාගෙන සිටින අපි අභ්‍යාසයේ අවසන් ක්‍රියාන්විතය සදහා අවසන් දිනයට දින කිහිපයකට පෙර සියලුම කණ්ඩායම් එක්ව තනි කණ්ඩායමක් බවට පත්වන්නෙමු. වනයේ වඩාත් සුන්දරතම දවස් කිහිපය එය ලෙස හැඳින්විය හැක. කිමද යත් තනි තනි කණ්ඩායම් වශයෙන් සිටිනවාට වඩා විශාල කණ්ඩායමක කොටසක් බවට පත්වු පසු අපහට ලැබුණු නිදහස සාපේක්ෂව ඉතා විශාල වු බැවිනි

කෙටියෙන් කිවහොත් අලුගුත්තේරු ක්‍රියාකාරකම් සහ හිතන වේලාවට හොරෙන් කෑම උයාගෙන කෑමට අප ලද අසීමිත නිදහස නිසාය. මේ අවසන් දින කිහිපය තුළ සැමන් ටින් අමුවෙන් ගිල දමා ආලවකයන් මෙන් ලොවි ගෙඩි ඇස් සහිතව වාසය කළ සෙබළුන් බහුල විය. තොප්පිගල ග්‍රීශ්මය තියා අපායේ ගිනි දැල්වලටවත් අමුවෙන් සැමන් කෑම නතරකල නොහැක. ඒවා එතරම් මිහිරි කෑම ය. අමු සැමන් පමණක් නොව අමු මැගී නූඩ්ල්ස් ද මේ වන විට ඉතා පහසු සහ සුලබ ආහාරයක් වී තිබිණි. නූඩ්ල්ස් තම්බා උයනවා වෙනුවට. අමුවෙන් නූඩ්ල්ස් කටක් සමග ජංගල් බොට්ල් එකෙන් වතුර උගුර බැගින් මාරුවෙන් මාරුවට ගිල දැමීම අපට කාලයත් ශ්‍රමයත් නින්දත් යන තුනම ඉතුරු කර දුන් ඉතා වටිනා ආහාර වේලක් විය. දින ගණනාවක් පුරා කැලෑ කොල අස්සේ කඩිමුඩියේ සැරිසරද්දී කෑමක් උයා පිහා ගන්නට වේලාව නොමැති වෙද්දී එවේලේ තිබුණු දේ අමුවෙන් කෑමට පුරුදුවීම වැළැක්විය නොහැකි වීම මේ සියල්ල පිටුපස තිබූ අනෙක් හේතුවය.

අවසන් දිනයේ හිමිදිරි පාන්දර අප විසින්ම සැලසුම් කර දියත් කරනු ලබන ප්‍රහාරාත්මක අභ්‍යාසයකින් පසු වනයේ පිටතට පැමිණ කිලෝමීටර් 10 ක පමණ පාගමනකින් පසු වලමංඩිය වන සටන් පුහුණු පාසැල් බිමට පැමිණ දින ගණනාවකින් පසුව ලැබුණු බත් පැකැට්ටුවලට අපි නැවත ක්ෂණික ප්‍රහාර රැසක් දියත් කළෙමු. බත් යනු කොයිතරම් උතුම් කෑමක්දැයි අපට පිවිතයේ සැබෑ ලෙසම දැණුනා නම් ඒ වන අභ්‍යාසය තුළදී ය. එමෙන්ම සවල් පාරවල් වලින් බත් කෑම යන්න සැබෑ ලෙසම අප අත්වින්දා නම් ඒ එදාය. බත් එච්චරකටම අපට වැදගත් ය. බත් ඇට ඉතා මිහිරි ය. පරිප්පු, කරවල,අල හොදි කුකුල් මස් යනු එදා සෑබෑම ආගම් ය.

දින ගණන් බොන්නට වත් හරි හැටි වතුර සොයා ගැනීම දුෂ්කර වු වනය තුළ රෙදි සේදීම මූණ සේදීම යනාදී කටයුතු අවශ්‍යබව මා මෙහි අමුතුවෙන් කිව යුතු නැත. එසේ දින ගනන් පැක් ඇතුලේ ඉදෙමින් පැහෙමින් තිබුණු යුනිෆෝම් පලු සොක්ස් පලු එවයින් එළියට කැන්දා සබන් ඩිංගකින් සංග්‍රහ කරද්දි දෝර ගලා ගිය ප්‍රීතිමත් කුණුවතුර කන්දරාවක සුඝන්ධය වචනයෙන් විස්තර කිරීම උගහට ය. කෙසේ හෝ වරුවක් පමණ කාලයක් ඔට්ටුවීමෙන් පසු යළි සමාන්‍ය මනුෂ්‍ය ආත්මයන්ට එළඹීමට අපට හැකිවූවායැයි මා සිතමි.ඉන් අනතුරුව ඉතිරිව තිබුණේ හොඳම ටිකය.

එය රාත්‍රි කඳවුරු ගිණිමැල සංදර්ශනයයි. සංදර්ශන නම් අන්න සංදර්ශන. දවස් 21 කට ආසන්න කාලයක් බඩේ බත් නැතුව බොන්නට හරි හමන් වතුර ටිකක් නැතිව යන්නට වැසිකිළියක් නැතිව වන වැදී ශිෂ්ඨාචාරයෙන් බැහැරව සිටි ප්‍රාග් මානව කල්ලියකට ක්ෂණිකව අරක්කු පෙවූ විට දිස් වන්නේ යම්කිසි වූ සංදර්ශනයක්ද අන්න එය එතන සිදු විය. එදා දුන්නේ අරක්කු නොවූවත් ගතෙහි විඩාවෙන් දින සති ගනන් බැට කෑ සිටි සෑම සියල්ලන්ටම ඒ බීර බෝතල් දෙක චන්ද්‍රයා වටා කක්ෂගත වීමට හොඳටම ප්‍රමාණවත් විය.බොන් නැති එවුන්ගේ බෝතල්ද ඉල්ලාගෙන ගසා දැමූ තව බර සෙට් එකක් වැඩේ පටන්ගෙන පැයක් යද්දීම එහා ග්‍රහලෝකවල කක්ෂගතව කබරයින් හා පෙමින් සිටිනු දැකිය හැකි විය. රොබින් හුඩ්ගේ සෙට් එක අල්ලා සිරකරදාට නොටිංහැම් බලකොටුවේ ශෙරීෆ් සහ ගිස්බන් ඇතුලු ටීම් එක නස වෙන්න ගසා මේස පෙරළාගෙන නන්නත්තාර වන්නේ යම් සේ ද එදා වුණේ ඒ දේමය.

සංදර්ශනය වෙනුවෙන් අපේ කණ්ඩායමෙන් ඉදිරිපත් කලේ අපාය ආශ්‍රිත සංකල්පයක් ඇතුළත් නාට්‍යයක්ය. එහි ප්‍රධාන නළුවා හෙවත් යම රජු වූයේ කොටාය. නාලු වෙන්න ගසා සිටි කොටා අපායට එන එවුන් හට රඟපෑම අමතක වී රියල්ම කනේ පාරවල් සටාස් ගා ගසා දමණු දක්නට හැකි විය. අපායට යන එවුන් ද කොටා දෙන පනිෂ්මන්ට් නාට්‍යය අමතක කර සිරාම ආකාරයෙන් සිදුකරනු දැක ගත හැකි විය. තාත්වික රංගන නම් ඒවා ය. නාට්ටිය අවසන් වන විට නළුවන් බොහෝ දෙනාගේ මූණේ ඇඟිලි පාරවල්ය. එවන් අමරණීය අත්දැකීම් රැසක් අප ජීවිතවලට මුසු කළ වනඅභ්‍යාසය හෙවත් වන බඹරා එසේ නිමා විය. එය අප හට හුදෙක් වනය තුළ සිදුවූ අභ්‍යාසයක් පමණක් නොවීය.

සොබා දහමට මුසු වී එහි රිද්මයත් සමග යුද සෙබළෙකු වනයේ විසිය යුතු ආකාරයත් එහිවූ දහසකුත් එකක් කායික මානසික දුෂ්කරතා දරාගනිමින් නමුත් එයට අඹමල් රේණුවකවත් හානියක් නොකරමින් වනයම ආශිර්වාදයක් කරගනිමින් සතා සිවුපාවාගෙන් වන කරදර පවා සිදු නොවන තැනට ජීවිතය ගෙන යන්නට ඉගැන්වූ මහානර්ඝ පාඩමක් විය. සමස්ත වන අභ්‍යාසය පුරාවටම අප උගත් සියලු දේ කැටි කරමින් මා හට එක දෙයක් පැවසිය හැක. එය මා උගත්තේද ඒ වන අභ්‍යාසය තුළදීම එවකට අප සමග සිටි විශේෂ බලකා නිලධාරියකු වූ මේජර් බුලත්සිංහල සර්ගේ මුවිනි.

“ වනය සෑම විටම උදාසීන ය. ඔබද ඒ තුළදී එසේම විය යුතුය ”



**සටහන :-**

**මේජර් අෂාන් සංජීව**
**විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය**

## දිවියට ඔවදනක් ...

- සෙබළා යන කැටයම කැපිය හැක්කේ පුහුණුවේ ඇති දුෂ්කරතාවය මතය.
- සැලැස්මෙන් තොරවූ විට ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කළ යුතුය.
- සෑම සටන්කරුවෙකුටම සටන් පුහුණුව තුළින් සිත දමනය කිරීමට හැකිනම් එය පුහුණුවේ දියුණුවයි.

ලා/කෝ හර්ෂ ජයසිංහ ඩබ්ලිව්පීආර්
සෙවිලේකා - ශ්‍රීලංයුහසෙව්බමු

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කර්නල් ඩබ්ලිව් එම් ඩී එස් කේ ගුණවර්ධන ආර්එස්පී කේඑස්පී



ශ්‍රී ලංයුහසෙව්බ මූලස්ථානයේ කර්නල් යුසේලේ ලෙස කර්නල් ඒ ඒ ඩී පී කුලතිලක යුඑස්පී පීඑස්සි



61 සේමු කර්නල් සම්බන්ධීකරණ නිලධාරි(සෙවි) ලෙස කර්නල් ඩී එස් රණසිංහ කේඑස්පී



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථානයේ නිලධාරි ශාඛාවේ මානි I (පොදු) ලෙස මේජර් ඒ එම් ඩබ් ආර් වී අබේසේකර ශ්‍රීලංසිරෙ



2 (සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් එම් එස් ගුණසේකර ශ්‍රීලංසිරෙ



11 (සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් එම් ඩබ්ලිව් එම් උදය කුමාර ශ්‍රීලංසිරෙ



15 (සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් ආර් එම් ජේ බී රාජපක්ෂ ශ්‍රීලංසිරෙ



15 (සෙවි) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් ඩබ්ලිව් ආර් ප්‍රසන්න ගරෙ



2 වන (සෙවි) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බළකායේ අණදෙන නිලධාරි ලෙස මේජර් ඩබ්ලිව් ඒ ඩී ජයසුන්දර විපාරෙ



3 (සෙවි) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් ඩී පී ඩබ්ලිව් එම් එස් පී විජේකෝන් පීඑස්සී විපාරෙ



2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ අණදෙන නිලධාරි ලෙස මේජර් ඩී එම් අයි එස් පී දිසානායක ශ්‍රීලංරබ

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...




13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් ජී එස් එල් තුෂාර ශ්‍රීලංජාආබමු



14 වන ශ්‍රී ලංජාආබමු දෙවන අණදෙන නිලධාරි ලෙස මේජර් එච් එම් එල් ආර් එස් කේ හේරත් ශ්‍රීලංජාආබමු



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථානයේ නිලධාරි ශාඛාවේ මානි II (දුක්ගැනවිලි) ලෙස මේජර් කේ ඒ එස් එන් සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ගැහේබ



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථාන බළඇණියේ විධායක අධිකාරි ලෙස මේජර් එල් ටී පී ඩී ද සිල්වා ශ්‍රීලංසසබ



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථානයේ නිලධාරි ශාඛාවේ මානි II (විනය) ලෙස මේජර් මේජර් එල් එච් ආර් එන් පී කබ්රාල් ශ්‍රීලකාහ



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථානයේ පාලන ශාඛාවේ මානි II (පොදු) ලෙස මේජර් ඕ වී එස් අයි ආර් කේ විතානගේ ආර්එස්පී ශ්‍රීලපාහ



ශ්‍රීලංයුහසෙව්බ මූලස්ථානයේ ජනමාධ්‍ය නිලධාරි ලෙස ලුතිනන් එස් පී ඩී සෙනරත් ශ්‍රීලයුපොදුසේබ



11 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බලලත් නිලධාරි I එච් ඒ එස් ඩබ් හෙට්ටිආරච්චි



15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බලලත් නිලධාරි I ජී ජේ ආර් විජිත කුමාර



2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි I ඊ එච් එම් ඩී සමන් කුමාර



15 වන ශ්‍රීලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ ප්‍රධාන ලිපිකරු ලෙස බලලත් නිලධාරි II ප්‍රියශාන්ත ඩබ්ලිව්ආර්



14 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රධාන ලිපිකරු ලෙස වරිෂ්ඨ සැරයන් ගුණවර්ධන ඩීඩීසී



# නිර්මාණ අසපුව ...

## අහිමි සෙනෙහස

මගේ හදවත ගැහෙන තරමට
බලන් ඉම් ඔය හඬ අසන්නට
නිදන නෙත් යුග රැය පුරාවට
මතක් වෙන්නෙම නුඹෙ සිනාහවයි

නුඹෙ නළලට හාදු දෙන්නට
දෙතොලගින් පිනි බිඳු තබන්නට
දෙනෙත් කැල්මේ සුව විඳින්නට
සිත කියයි නුඹ සොයා එන්නට

සුවනි ළයේ මම හිස තියන්නද
හාදු වැස්සෙන් එය තෙමන්නද
සෙනෙහසක මල් පුබුදු වන්නට
එපා නම් මම හැරී යන්නද

සෙ/එල්100738
කෝප්‍රල් වීරකෝන් ආර්එල්කේ
10(සෙව) විපාරේ
මරදන්කේනි, යාපනය

## විරුවනි අප රැකුනෙ ඔබ පිහිටෙන් නියම

සාමය ලබාදී ජීවිත සැම රකිමු කියාලා
මාවිල්ආරුවෙන් ඇරඹුව සටන ඔයාලා
රට ජාතියට ඇප කැප වූ දිරිය පුතුන් වෙලා
අද අභිමනින් සිහි කරනෙමි සිරස නමාලා

මුහුණට මුහුණ සතුරන් හා යුද වැදුනේ
මරණය පෙනිපෙනී කොහොමද හිත හැදුනේ
සතුරන් එකා දෙන්නා බිම පතිත උනේ
රණවිරු ගැම්ම ඒ මොහොතෙදි මතක් වුනේ

පිවිතයේ තරුණ ජවය මහ වනයට ගැබ් කරලා
කුසට අහරක් නොමැතිව දින ගණනක් දුක් විඳලා
කයට දැනෙන තෙහෙට්ටුකම නොදැනී ගිනි අව් දරලා
හිතේ චිත්ත දහිරිය මත ඉදිරියටම ඇදුනා සැවොමා

යනවිට පෙරට යුද පිටියට සැම දිනම
මතකට නැගුනේ නැතිදෝ පවුලේ සැවොම
ඔබ යුද කෙරුවේ රට වෙනුවෙන් මයි අරුම
විරුවනි අප රැකුනෙ ඔබ පිහිටෙන් නියම

මියගිය සෙබලු සැම දිනකම සිහි වේවා
ආබාධිත සෙබළ සිත් සුවපත් වේවා
සේවයෙ යෙදන විරුදරුවනි සෙත්වේවා
තුන් සිංහලේ නම සැමදින වැජඹේවා

සෙ/15ඊ 01143 කෝප්‍රල් ජයවර්ධන කේඑච්එම්ඒ
15(සෙව) ශ්‍රීලංසිරෙ
පෙරියවලයන්කට්ඩු
වව්නියාව

## අත්තම්මා

සතුටු මල් මිටි එක්ක හිරුට පෙර ලොව දැකපු
මැදියමේ රෑ තෙක්ම එක දිනක දිග මැනපු
පුතුන් රජ නොවු මුත් වියත් කැළ මැද ඉන්ට
අකුරු නොමදත් නුඹෙන් ලද සවිය මහමෙරක්

කිතුල් පිටි තලප රස කොල්ලු මාළුව එක්ක
සඟ පුතුට දන් තනපු දිවැස් නැති දෙව්දුවේ
දුක වැවුණු මාවතේ සුවඳ මල් පැල කරපු
පැටවුන්ගෙ හිත් අහසෙ දිලුන සඳ රැජිනියේ

සසර දුක දැනහැඳින නිවාලන මං සොයපු
සියක් වස ඉක්මවා ආයු සැප වරණ ලැබු
සිව් මුණුපුරුන් දැකල සඳහටම සමුගත්තු
රන්මැණිකෙ නැති වුනා ගමට දිස්නය දීපු

කපිතාන් දිල්හාරා දිසානායක
ප්‍රකාශන අංශය - ශ්‍රීලංයුහසෙව්බමු

## නුඹ

රිදුනත් නිවුනා හදවත සිහිවෙද්දි ඔයා
මට මතකයි වෙන්වූවා අප නගරයෙන් එදා
ඔබෙන් වෙන්ව ගිය මසිතට තීරණය හුදකලා
නිසල යුදගනා වැව මට දුනි නිහඬ වේදනා

අහංකාරකම් පෙන්වූ මගෙ සිතට හොරා
මා වින්දේ ඔබ මගේම ජීවිතේ සිතා
රහතන් කන්දේ සිතුවිලි සිත යටට වෙලා
ඉන්නම් රත්තරන් ළඟ වෙහෙරකට වෙලා

සොඳුරු බසින් අමතන්නද සුදු නෝනා කියා
විහාරයට මල් ගෙන එනවද කඳවුරට හොරා
නොඑනවානම් කඩදයියක නොඑන වැයි ලියා
මගෙ සිතට දුක දැනෙන කවි ලියනු එපා

සෙ/පී101366 ලාකෝ හර්ෂ ජයසිංහ
සෙව්ලේකා - ශ්‍රීලංයුහසෙව්බමු






තුන්වන වියට පාතැබූ
මිතුජ ආදිත්‍ය පුතුට
සු'පැතුම් පතන්නේ සැරයන්
රෝෂණී එච් ඒ ආර් මව
සහ පියා ඇතුලු
පවුලේ සැම



නමවන වියට පා තැබූ
මනේජ තිසරිදු පුතුට
සු'පැතුම් පතන්නේ සැරයන්
වික්‍රමතිලක එන්එම් පියා, ලා/කෝ
හෙට්ටිආරච්චි එච්ඒඒඑස් මව
ඇතුලු පවුලේ සැම



තුන්වන වියට පාතැබූ
තෙනුකි දහම්සා දියණියට
සු'පැතුම් පතන්නේ සාසෙ
නවරත්න ඊපීඑම්එස් පියා
සහ මව ඇතුලු
පවුලේ සැම



හත් වන වියට පා තැබූ
තරුෂ සෙනෙහස් පුතුට
සු'පැතුම් පතන්නේ ලාකෝ
තිලකසිරි පීපීඩබ් පියා
සහ මව ඇතුලු
පවුලේ සැම



පළමු වියට පා තැබූ නවෝෂි
දහම්සා දියණියට සු'පැතුම්
පතන්නේ ලාන්ස් කෝප්‍රල්
මධුසංක කේඩීඩී පියා
සහ මව ඇතුලු
පවුලේ සැම




සිව්වන වියට පා තැබූ
නෙමන්තා නානායක්කාර
දියණියට සු'පැතුම් පතන්නේ
සැරයන් ප්‍රියංකර පියා සහ
කෝප්‍රල් අබේසිංහ මව
ඇතුලු පවුලේ සැම



තෙවන වියට පා තැබූ අසනි
ශෂිකලා දියණියට සු'පැතුම්
පතන්නේ ලා/කෝ මදුවන්ත
පීඑම්ආර්ඞී පියා
සහ මව ඇතුලු
පවුලේ සැම



තෙවන වියට පා තැබූ
එසද දිනෙත් දිව්මින පුතුට
සු'පැතුම් පතන්නේ කෝප්‍රල්
මධුසංක ඩීජීඑල් පියා
සහ මව ඇතුලු
පවුලේ සැම




# ප්‍රහේලිකාව 7

"රණවිරුණ පාඨක" ඔබගේ වින්දනයට සහ දැණුම උදෙසා ඉදිරිපත් කරනු ලබන ප්‍රහේලිකාව සම්පූර්ණ කර අප වෙත එවන මෙන් ඉල්ලා සිටිමු. ජයග්‍රාහී පාඨකයා ඊළඟ කලාපයේ ප්‍රකාශයට පත් කරන අතර, ජයග්‍රාහකයා වෙත වසරක කාලසීමාවක් සඳහා **රණවිරුණ** කලාප නොමිලේ ලබාදීමට කටයුතු කරයි.

## උපකාරක පද

හරහට

01. අවිහිංසාවාදයේ පියා වේ.
04. ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය මෙය වේ.
05. පබාවතියට පෙම් බැඳි රජතුමා වේ.
06. ග්‍රහයන් නව දෙනාගෙන් කෙනෙකි.
07. කුඩා දරුවන්ට ...............ගාය ඇතිවේ.
08. වටිනා ලෝහයකි.
11. සමූහය යන්නට සමාන වචනයකී.
12. මධ්‍යම කඳුකරයේ පිහිටි ලෝක උරුම ප්‍රදේශයකි.
16. රජකාලයේ පැවැති සේවයකී.
17. වෙස් මුහුණු කැපීමට ගන්නා දැව විශේෂයකි.
20. සිංහල අවුරුදු චාරිත්‍ර වසරක් පාසා ......... අනුව සිදු කරයි.
21. වත්මන් යුද්ධ හමුදාධිපතිතුමා අයත් රෙජිමේන්තුව මෙය වේ.

පහළට

01. ..........සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසු යැයි කියමනක් ඇත.
02. මාලදිවයිනේ අගනුවර මෙයවේ.
03. විද්‍යා චක්‍රවර්තීන් විසින් රචිත ගද්‍ය කෘතියකි.
05. තැන තැන ........... නොදමන්න.
06. කෙසෙල් කැන් වලට යෙදෙන සමාන පදයකි.
07. මෙම අදහස් තියෙන අය අද සමාජයේ බොහෝ සිටිති.
09. අසල්වැසි රටේ එක් සංගීත සම්ප්‍රදායක් වේ.
10. පැදුරු, මලු විවීම සඳහා මෙම අමුද්‍රව්‍ය භාවිතා කරයි.
13. අප රටේ පැරණි දෙපාර්තුමේන්තුවකි.
14. සෙලවෙන පාළම හඳුන්වන තවත් නමකි.
15. ශ්‍රී ලංකා ඉතිහාසයේ මේ නමින් රජවරු කිහිප දෙනෙක් සිටියහ.
18. තුනපහට අයත් කුළුබඩු විශේෂයක් වේ.
19. මෙම ගසෙහි දළු ඖෂධ සඳහා යොදා ගනී.




# යුගදිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ ලාන්ස් කෝප්‍රල් සඳමාලි කේඑච්වීපී 5 (සෙවි) ශ්‍රීලයුකාබ හා මංගල වික්‍රමසිංහ මහතා



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ සාමාන්‍ය සෙබළ ද සිල්වා ටීපීපී 12 ශ්‍රීලංජාඇබමු සහ ටහානි රංගිකා ලසාදනි මෙනවිය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ කෝප්‍රල් ලක්ෂිත ඩබ්ලිව්ජේ හා දිලේකා මදුෂානි මෙනවිය.

## ප්‍රහේලිකා අංක 06 ජයග්‍රාහකයා

සාලින්ද කුමාර රාජපක්ෂ
නො -: 180
කොටගෙදර
කනදෙණියාවල.

ප්‍රහේලිකා අංක 06 ජයග්‍රහණය හිමිකරගත් ඔබ වෙත "රණවිරුණ" මෙසේ සුබපැතුම් එක්කර සිටින අතර, ජයග්‍රහණය වෙනුවෙන් ඉදිරි කලාපයේ සිට **වසර 01 ක කාලසීමාවක් සඳහා රණවරුණ සඟරාව නොමිලේ ඔබ** වෙත ලබා දෙනු ඇත.



# සදානුස්මරණීය ඔබ...

පොළව දෙදරා අහස ගුගුරා
යමවී සිහ හඬ පතුරලා
බලවී දස අත මව්වරුන්ගේ පිරුණු
ළැම කිරි උතුරලා
ජේ කරන්නට බැරි උනත් පැන්
කළේ පිරිතෙන් මතුරලා
ගලවී ජය ගඟ සේම නොබියව
නිල්ල පා යට අතුරලා.......

පණට පණ ඉල්ලනා ලෝකෙක
රකින ජීවිත හුස්ම අල්ලා
බලා ඉන්නැති නොයෙන ගමනක්
යද්දි මිහිමව දෙනෙත් දල්ලා
නේක දොම්නස් මැදින් නොබියව
ගියත් නෑ කිසි දෙයක් ඉල්ලා
සිහළ මව කෙලෙසන්න නොමදුන්
විරුවණට රණ ගී ලියල්ලා......

මතක පොත්වල නමත් නොලියා
මියුණු තරමක් බලල්ලා
පුංචි උන් ලංකරන් ඒ ගැන
ආදරෙන් තතු කියල්ලා
ඉපදුනොත් යළි මේ බිමේ
මව්වරුනි කුස ඉඩ තියල්ලා
තුණුරුවන් බල සිහිකරන හැමවිට
විරවණගේ ගුණ ගයල්ලා.......

උපන් මාතෘභූමිය වෙනුවෙන් තම රුහිරය මුදා හරිමින් දිවි පූජාකළ සියලුම විරුවන් එකසිය හතළිස් වසරක ඉතිහාසය සමරන මේ මොහොතේ අභිමනින් යුතුව සිහිපත් කර සිටින්නෙමු.